<u>මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව</u>

<u>**2022 සැප්තැම්බර් 15 වන දින**</u>

❖ **08 වන සැසි වාරයේ 53 වන සභා වාර්තාව**

දිනය :- **2022.09.15** වන දින

වේලාව :- **පෙ.ව.10.00**

ස්ථානය :- **ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය**

<u>පැමිණීම</u>

| | |
|---|---|
| 01. ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. ගරු ප්‍රා.ස. ම. ජේ.එල් ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |
| 05. ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් කුමාර ගරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 06. ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 07. ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 09. ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10.ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 11. ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා. | පෙ.ව.10.00 |
| 12. ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 13. ගරු ප්‍රා.ස.ම. කේ.කේ.ජී. සුමේත්‍රා මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 14. ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 15. ගරු ප්‍රා.ස.ම. සී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 16. ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 17. ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 18. ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 19. ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |
| 20.ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය. | පෙ.ව. 10.00 |

21.ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා — පෙ.ව. 10.00

22. ගරු ප්‍රා.ස.ම. එන්.ඒ.එස්. වීරසිරි මැතිතුමියා — පෙ.ව. 10.00

23.ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගෙ මැතිතුමිය. — පෙ.ව. 10.00

24.ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පත්ම තිලක් මැතිතුමා. — පෙ.ව. 10.00

25.ගරු ප්‍රා.ස.ම. ඊ.බී. ඉන්දික මැතිතුමා. — පෙ.ව. 10.00

26.ගරු ප්‍රා. ස. ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා — පෙ.ව. 10.00

27.ගරු ප්‍රා.ස.ම. කේ.රන්ජන් වීරසේකර මැතිතුමා — පෙ.ව. 10.00

28.ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ. සංජීව මැතිතුමා. — පෙ.ව. 10.00

29. ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය — පෙ.ව. 10.00

**<u>සහභාගී වූ නිලධාරින්</u>**

01. ලේකම (වැ.බ) - එම්.දිනුජිත් රන්දූල මයා.

02. කළමනාකරණ සේවා නිළධාරි - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

**<u>ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගි වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කවුවන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ සැප්තැම්බර් මස මහ සභා රැස්වීම සඳහා සහභාගි වන ගරු උප සභාපතිතුමන්, හිටපු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගි වන ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියන් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**<u>හිටපු ගරු සභාපති හා ප්‍රා.ස.ම. යූ.ජී ධර්මසිරි මැතිතුමන් වෙනුවෙන් ශෝකය පළ කිරීම</u>**

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

මුලින්ම පසුගිය දිනක අප අතරින් වියෝ වූ හිටපු ගරු සභාපති හා දැනට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ යූ.ජී. ගමගේ මැතිතුමන් වෙනුවෙන් ශෝකය පළ කිරීම සඳහා සියලු දෙනාටම විනාඩියක් නිශ්ශබ්ධතාවයක් සඳහා ආරාධනා කරනවා. ඉන් අනතුරුව සියලු දෙනාටම තම තමන්ගේ පක්ෂ නියෝජනය කරමින් එතුමාගේ ගුණ සිහිකරමින් ගෞරව දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>**

ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. ගරු හිටපු සභාපතිතුමන් වගේම දැනට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ යූ.ජී.ධර්මසිරි මැතිතුමන් පිළිබඳ වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳ ස්තුති වන්ත වෙනවා. එතුමන් මේ ප්‍රාදේශීය සභාවේ

අපි සමග විශාල කාලයක් කටයුතු කළ අයෙක් වගේම කුඩා කළ සිටම අප එකට හැදිලා වැඩිලා එකට ජීවත් වූ අය හැටියට පක්ෂ දේශපාලනය තුළ පිල් දෙකක කටයුතු කළත් අප අතර කිසිම දවසක කුමන ප්‍රශ්න ආවත් තරහක් තිබේ නියා නොගත්තු කෙනෙක් ලෙස මෙතුමා හඳුන්වන්න පුළුවන්. එතුමා සභාපති ලෙස කටයුතු කළ කාලය තුළ ඉතා සුහදව ඒ කටයුතු කරමින් ප්‍රදේශයේ ජනතාවට නැතුවම බැරි පුද්ගලයෙක් ලෙස ජීවත් වුණා. එතුමා සභාපතිවරයෙක් ලෙස පමණක් නොව පාසල් ආචාර්යවරයෙකු ලෙස විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කළ කෙනෙක් විදියට හැමදාමත් සුහදශීලි ලෙස ප්‍රදේශයේ නැතුවම බැරි චරිතයක් වුණා. මේ අවස්ථාවේ මාගේ පෞද්ගලික ශෝකයත්, පවුලේ ශෝකයත්, හිටපු ගරු අමාත්‍ය ආනන්ද කුලරත්න මැතිතුමන්ගේ ශෝකයත් , එක්සත් ජාතික පක්ෂයේ ශෝකයත් ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. සියලූ දෙනාටම ස්තුතියි.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

සියලූ දෙනාගෙන්ම අවසරයි. සභාවක් ලෙස අප සමග කටයුතු කළ ගමගේ සභාපතිතුමන් පිළිබඳ නැවත ආවර්ජනයක් කරනවා නම් එතුමා දේශපාලන ගමන් මගෙහි දීර්ඝ ඉතිහාසයක් ඇති පුද්ගලයෙක්. එතුමා වෙනුවෙන් අවමංගල්‍ය සභාවට සහභාගි වූ පිරිස දැක්කම එතුමා ජීවත්ව සිටි කාලයට වඩා මියගියාට පසු එතුමාගේ වටිනාකම වැඩිවෙලා තියන ආකාරය අපි දුටුවා. මොකද
මැත පරම්පරාව නොදැනගත්තත් එවකට සිටි දේශපාලන නායකයින් සමග එක්ව ගොමඩිය, අළුපොත්දෙනිය ගම්මාන බවට පත් කරන්නට විශාල මෙහෙයක් සිදු කළ ආකාරය එවකට සිටි පරම්පරාව දන්නවා. ගොමඩිය , කරිවිලකන්ද ආදි ප්‍රදේශ කියන්නේ වාහනයක් යවලා පාරක් කපා ගන්න බැරි ප්‍රදේශ. ඒ නිසා එතුමන්ට මේ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා විශාල දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්න වුණා. අද පත්වන දේශපාලන අධිකාරියට මේ ප්‍රදේශ වල ඉතා කුඩා දෙයක් තමයි කරන්න තියෙන්න. ඒ පාරවල්, ගම්මාන සංවර්ධනය කරපු දුෂ්කර කාලය අවසන්. මේ කාර්යයන්හි පෙර ගමන්කරුවා ලෙස මෙතුමන්ව හඳුන්වන්න පුළුවන්. මුදලින් රුපියල් ගත හම්බ නොකළාට එතුමා මිනිසුන් හම්බ කළ කෙනෙක්. මාගේ පෞද්ගලික ශෝකයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ දිස්ත්‍රික් නායක වරුන්ගේ ශෝකයත් එතුමන්ගේ පවුලේ සියලූ දෙනා වෙනුවෙන් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරන අතරම මේ සභාවේ විවිධ ධූරකාලයන් තුළ පත් වූ සභාපතිවරුන්ගේ ඡායා රූපයක් සහ ඔවුන්ගේ ධූර කාලයන් පිළිබඳ මෙහි ප්‍රදර්ශනය කිරීම සුදුසු බවත් යෝජනා කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. එච්.කේ. ඒ. ආනන්ද කුලසුන්දර මැතිතුමා</u>

සියලූ දෙනාගෙන්ම අවසරයි. මේ අවස්ථාව ලබා දීම පිළිබඳ ගරු සභාපතිතුමන්ට ස්තුතියි. හිටපු ගරු ප්‍රා.ස.ම. යූ.පී.ගමගේ මැතිතුමන් ඉතා නිහතමානී මනුෂ්‍යයෙක්. අපි සමග එකට කටයුතු කළ අයෙක් විදියට අපි හඳුනාගත්ත විශේෂ ලක්ෂණ කිහිපයක් මා දැක්කා. ඔහු ඕනෑම පුද්ගලයෙකුට උදව් කරන කෙනෙක් . කුහක කමක් නැති විවෘත පුද්ගලයෙක් විදියට මා ඔහුව හඳුනාගත්තා. වෙනත් බාහිර පාර්ශව මගින් ඇතැම් අවස්ථා වල ඔහුව නොමගට යොමු කළත් ඔහු ඕනෑම පුද්ගලයෙක් වෙනුවෙන් උදව් කිරීමට ඉදිරිපත් වූ අයෙක්. ඒ නිසා එතුමන්ගේ වියෝව අපේ ගරු සභාවට වගේම අපිටත් විශාල පාඩුවක් වුණා. එතුමන්ගේ පවුලේ අය වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණෙහි ශෝකය ප්‍රකාශ කිරීමට මෙම අවස්ථාව යොදා ගනු ලබනවා. .

<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ජිනනායක මැතිතුමා</u>

ගරු . සභාපතිතුමන් ඇතුළු සියලුම දෙනාගෙන් අවසරයි. මා යූ.පී.ධර්මසිරි මැතිතුමන්ව හඳුනාගත්තේ ඔහු ගුරුවරයෙක් ලෙස. පසුව දේශපාලන පක්ෂ දෙකක් නියෝජනය කරමින් අපි හමුවුණත් එතුමා ලඟ කිසිදාක මත ගැටුම් ඇති කර නොගෙන ඉතා සුහදශීලිව කටයුතු කළ කෙනෙක් විදියට තමයි මා ඔහුව දකින්නේ. ඉතා නිහතමානී, උතුම ගතිගුණ ඇති පුද්ගලයෙක්, සෑම කටයුත්තකදීම ඉතා සරලව කටයුතු කළ කෙනෙක්. එතුමාගේ වියෝව ගමට, සභාවට වගේම රටටත් විශාල පාඩුවක් විදියට තමයි මා දකින්නේ. මාගේ පෞද්ගලික ශෝකයත් , ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයින්ගේ ශෝකයත් එතුමන්ගේ පවුල වෙනුවෙන් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා</u>

ගරු සභාපතිතුමන් ඇතුළු සියලූ දෙනාගෙන් අවසරයි. යූ.ජී.ගමගේ මැතිතුමන් කුඩා කළ සිටම මා හා එක්ව මිත්‍රයෙක් ලෙස සියලූ ප්‍රශ්න වලදී සිටි කෙනෙක්. එතුමන් ඉතා නිහතමානි පුද්ගලයෙක් ලෙස මා දකිනවා. තමන් වෙනුවෙන් වත් යමක් නොකර තමන්ගේ කෙනෙක් වෙනුවෙන් වත් රැකියාවක් නොදී එතුමා සමාජයේ අනෙක් පුද්ගලයින්ට සේවය කළා. පසුව එතුමන්ගේ බිරිදට රැකියාව ලබා දුන්නේ අපේ හිටපු ආරියදාස සභාපතිතුමන්. ඒ ආකාරයට තමන්ගේ අය වෙනුවෙන් කිසිදාක වැඩ කළේ නැහැ. තමන්ගේ රෝගී තත්වය පිළිබඳ හෝ සැලකිල්ලක් නොදක්වමින් එතුමා අපි සමග කිසිදූ පක්ෂ භේදයකින් තොරව කටයුතු කළ කෙනෙක්. එතුමන් හට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

## 01. පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.

2022 සැප්තැම්බර් මස 15 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම එන්.ඒ.එස්.වීරසිරි මැතිතුමිය**

ගරු සභාපතිතුමණි, පසුගිය සභා වාර්තාවේ 28 පිටුවෙහි සඳහන් වෙන්නේ මම විදි ලාම්පු සකස් කිරිම පිළිබඳ කථා කළේ පාසල් සිසුන් සඳහා පවතින දුෂ්කරතා හේතුකර ගෙන වුවත් එය මෙහි සඳහන් වෙන්නේ ඇඟලුම් කර්මාන්ත වල සේවිකාවන් වෙනුවෙන් කියලා. එය සංශෝධනය විය යුතුයි.

**ගරු ප්‍රා.ස.ම.ප්‍රදීපා නිසංසලා මැතිතුමිය**

ගරු සභාපතිතුමණි, පසුගිය සභා වාර්තාවේ 07 වන පිටුවෙහි කටුවන මාළු පොළෙහි වතුර එකතු වන ස්ථානය පිළිබඳ මා විමසීම කළත් එතන ගරු ප්‍රා.ස.ම. මානෙල් මැතිතුමියගේ නම තමයි සඳහන් වෙන්නේ.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

වාර්තාවේ මෙම සංශෝධනයන් සකස් කරන්න. නිහඬතාවයෙන් පෙනී යන්නේ තවදුරටත් පසුගිය සභා වාර්තාවේ සංශෝදන නොමැති බවයි. ඒ අනුව සංශෝදිත වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. අයි.කේ.සුසන්ත පද්ම තිලක් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 සැප්තැම්බර් මස 15 වන දින පැවති සංශෝධිත මහ සභා රැස්වීමේ වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

පළාත් පාලන සහකාර කොමසාරිස් තුමන්ගේ අංක හපපා/ඩී/පුහුණු හා 2022.09.05 දිනැති ලිපිය මගින් පළාත් පාලන ආයතන ප්‍රධානීන් සහ සභිකවරියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022. සැප්තැම්බර් මස 20 වන දින තංගල්ල නගර ශාලාවේදී පැවැත්වෙන බව දන්වා තිබෙනවා. ඊට අදාල ලිපිය අවශ්‍ය අය වෙත ලබා දී තිබෙනවා. ඒ සඳහා සහභාගී වන ලෙස දන්වා සිටිනවා.

## 03. ප්‍රාදේශිය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා

**සන්නිවේදන -** නැත

## 04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05. යථා පරිදි කල් දී ඇති යෝජනා.

## 05 – 1. 2023 වර්ෂයට කටුවන ප්‍රාදේශීය සභාව සතු දේපල බදු දීම සම්බන්ධවයි

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

2023 වර්ෂයට කටුවන ප්‍රාදේශීය සභාව සතු දේපල බදු දීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 34/ ආදායම් ii හා 2022.08.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2023 වර්ෂයට කටුවන ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් දේපල නිරණය කරන ලද ලංසු මුදල අනුව ටෙන්ඩර් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

| දේපලෙහි නම | 2022 වර්ෂයේ ටෙන්ඩර් මුදල රු. | 2022 වර්ෂයේ ටෙන්ඩර් තැන්පත්(ආපසු ගෙවනු ලබන) රු. | 2022 වර්ෂයේ ටෙන්ඩර් පෝරම ගාස්තු (ආපසු නොගෙවනු ලබන) රු. | 2023 වර්ෂයට ලංසුව රු. |
|---|---|---|---|---|
| මිද්දෙනිය බස්නැවතුම්පල පොදු වැසිකිළිය | 112050.00 | 2000.00 | 500.00 | 115200.00 |
| මිද්දෙනිය නගරයේ රථවාහන නැවතුම් බදු අයකිරීම | 129800.50 | 3000.00 | 500.00 | 135000.00 |
| මිද්දෙනිය නව වෙළඳපොළ වැසිකිළිය | 25200.00 | 2000.00 | 100.00 | 28800.00 |
| හිරම පොදු වෙළඳපොළ ඉඩමේ පොල් එළදාව | 15530.00 | 2000.00 | 120.00 | 16750.00 |
| හිරම උප කාර්යාල භූමියේ පොල් එළදාව | 1850.00 | 300.00 | 100.00 | 2200.00 |
| වැලිපිටිය හිගුරවැල් ගොඩැල්ල ඉඩමේ පොල් එළදාව | 2022 වර්ෂයට ටෙන්ඩර් කලද ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් වී නැත.<br>1215.00- පළමුවර ලංසුව<br>1093.50 - දෙවන වර ලංසුව<br>984.15 - තෙවන වර ලංසුව | 300.00 | 100.00 | 1000.00 |
| වැලිපිටිය වත්තහේන ඉඩමේ පොල් එළදාව | 2022 වර්ෂයටටෙන්ඩර් කලද ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් වී නැත.<br>2300.00- පළමුවර ලංසුව<br>2070.00- දෙවන වර ලංසුව<br>1863.00 - තෙවන වර ලංසුව | 300.00 | 100.00 | 1900.00 |

| | | | | |
|---|---|---|---|---|
| කරමැටිය පොදු වෙළඳපොළ වැසිකිළිය | 2022 වර්ෂයට ටෙන්ඩර් කළද ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් වී නැත.<br><br>2025 - පළමු වර ලංසුව<br>1822.50 - දෙවන වර ලංසුව<br><br>1640.25 - තෙවන වර ලංසුව | 300.00 | 100.00 | 1640.00 |
| මිද්දෙනිය උකුර වැවෙහේන කජ්ජුගස්කෝරටුව ඉඩමේ පොල් එළදාව | 1200.00 | 300.00 | 100.00 | 1500.00 |

කරමැටිය පොදු වෙළඳපොළ වැසිකිළිය, 2021,2022 වර්ෂ වල ටෙන්ඩර් කලද ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් වී නැත.

කටුවන පොදු වෙළඳපොළ නව ස්ථානයකට රැගෙන ගිය බැවින් කටුවන පොදු වෙළඳපොළ ආපනශාලාව 2022 වර්ෂයට ටෙන්ඩර් නොකරන ලදී.

ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

සභාපතිතුමණි, මිද්දෙනිය පොදු වැසිකිළියෙහි තත්වය කොහොමද? එහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළාද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඔව්, කොන්ක්‍රීට් කරලා සකස් කරලා දුන්නා. තවත් ටිකක් හදන්න තියෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍ර සේන මැතිතුමා</u>

මේ කරමැටිය වගේ පොදු වැසිකිළි ටෙන්ඩර් වෙන්නේ නැත්නම් මේවා පිරිසිදු කරලා තියාගෙන ආදායම ලබා ගන්න කවුරු හරි කෙනෙකුට දෙන්න පුළුවන් නේද? එහෙම නැත්නම් ටෙන්ඩර් කිරීමට තව දුරටත් දාන එකේ තේරුමක් නැහැ.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ගිය වර්ෂයෙත් අපි ඒ සඳහා අවස්ථාව ලබා දුන්නත් කෙනෙක් ඉදිරිපත් වුණේ නැහැ. අපේ සේවකයින් තමයි පොළ දවසට පිරිසිදු කිරීම කරන්නේ. මිනිස්සු වැසිකිළි භාවිතා කරනවා. නමුත් මේක පිරිසිදු කරගෙන ආදායමක් ගන්න කෙනෙක් ඉදිරිපත් වෙන්නේ නැහැ.

<u>ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

වැලිපිටිය ඉඩම් වල පොල් එලදාව ගිය වර්ෂයෙත් ටෙන්ඩරය ගියේ නැහැ. ඒකට විසඳුමක් නැද්ද? මේවායේ එලදාවක් ඇත්තටම නැද්ද? දිගින් දිගටම ටෙන්ඩර් වෙන්නේ නැත්නම් ඉවත් කරන්න තමයි වෙන්නේ.

<u>ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා</u>

මමත් මේ ඉඩම් පරීක්ෂා කළා. ඒවායේ පොල් එලදාවක් නැති තරම්, ඒ නිසා තමයි කෙනෙක් ඉදිරිපත් නොවෙන්නේ. තාවකාලික වගාවකට වගේ යොදා ගන්න පුළුවන් නම් හොඳයි.

ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා

මෙ ඉඩම් වල කාටහරි වගා කිරීම් කරන්න දෙන්න බැරිද?

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

එහෙම එකක් නැහැ. මේවා පරිස්සම් කර ගෙන පොල් එලදාව ගන්න ඕන. මේ ඉඩම් දෙකම එක ආසන්නයේ තියෙන්නේ. පොල් ගස් වලට සාත්තුවක් කරන්න ඕන. වෙන වගාවකට යන්නත් බැරි තරම් විශාල ගස් කිහිපයක් නිසා මෙහෙන හෙවණ වැටිලා තියෙනවා.

ගරු ප්‍රා.ස.ම.ජේ.එල්.ජයන්ත මැතිතුමා

ගරු සභාපතිතුමණි, මිද්දෙනිය රථ වාහන නැවතුම් බදු අය කිරීම් සම්බන්ධව එම ටෙන්ඩර් කරු වන අනුර මහතා මේ සම්බන්ධව සහනයක් ඉල්ලා සිටිනවා. ඔහුගේ ආදායම අඩු වීම නිසා මෙය ගෙවා ගන්න බැරි බව තමයි කිව්වෙ. එහෙම නැත්නම් වැඩි වෙලාවක් නතර කර ගෙන සිටින වාහන වලින් අය කරන මුදල වැඩි කරලා දෙන්න තමයි කියන්නේ. කතරගම නගරයේ වගේ නම් මේ ගාස්තු විශාල වශයෙන් වෙනස් වෙලා තියෙනවා. ඊට සාපේක්ෂව මේ ගාස්තු වැඩි කිරීම ගැන සළකා බලන්න.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අපි එම මහතාගේ ඉල්ලීම් සම්බන්ධව සළකා බලලා සභා අනුමැතිය සමග ආණ්ඩුකාර අනුමැතියට යවලා තියෙන්නේ. ඒ නිසා එම අනුමැතිය ලැබුණම ටෙන්ඩර් සදහා සහනයක් ලබා දෙන්න පුළුවන්. දැනට රථ වාහන වලින් රු. 100.00ක මුදලක් අය කරනවා. ඔහු රු.150.00 ක් දක්වා වැඩි කර දෙන්න කියලා ඉල්ලුම් කරනවා. අපි ඒ සම්බන්ධව අනෙක් සභාවන් වල සිදු කරන ආකාරය පිළිබදව සොයා බලලා එහෙම කරමු. එහෙම වුණොත් ටෙන්ඩර් මුදලත් වැඩි කරන්න වෙනවා.

ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා

අපි අනෙක් සභා වල තත්වයත් බලලා එහෙම තීරණයක් අරගෙන මේ වැඩේ කරමු. නැත්නම් ගැටළු ඇති වෙන්න පුළුවන්. සියලූ දෙනාටම එකම ගණනක් තියෙන්න ඕන නේ.

ඒ අනුව 2023 වර්ෂයට කටුවන ප්‍රාදේශීය සභාව සතු පහත සදහන් දේපල තීරණය කරන ලද ලංසු මුදල අනුව ටෙන්ඩර් කිරීම සම්බන්ධව විරුධ්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 2. 2023 වර්ෂය සදහා පෙර පාසල් ළමුන් බදවා ගැනීම

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

පෙර පාසල් ළමුන් බදවා ගැනීම - 2023 මැයෙන් අංක කප්‍රාස 31 හා 2021.09.05 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාව මගින් පවත්වා ගෙන යනු ලබන පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන 05 සදහා 2023 වර්ෂයට අදාළව ළමුන් ඇතුළත් කර ගැනීම සදහා අදාළ අයදුම් පත්‍ර 2022.10.01 දින සිට 2022.10.31 දින දක්වා මිද්දෙනිය හා කිරම ප්‍රාදේශීය සභා උප කාර්යාල වලදී ලබා දීමටත් ඉන්පසුව එම ළමුන් සම්මුඛ පරීක්ෂණ මගින් බදවා ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

අපි වෙන වර්ෂ වල වගේම ඇතුළත් වීමේ ගාස්තු සංශෝධනය කරලා නැහැ. වැඩි කරන්න කියලා ඉල්ලීමක් තිබුණත් මිනිසුන්ගේ ආර්ථික අපහසුතා නිසා අපි එහෙම කළේ නැහැ. වෙන වර්ෂ වල වගේම රු. 500.00ක් තමයි මෙවරත් ඇතුළත් කිරීමේ ගාස්තුව වෙන්නේ.

ඒ අනුව කටුවන ප්‍රාදේශීය සභාව මගින් පවත්වා ගෙන යනු ලබන පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන 05 සඳහා 2023 වර්ෂයට අදාළව ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා අදාළ අයදුම් පත්‍ර 2022.10.01 දින සිට 2022.10.31 දින දක්වා මිද්දෙනිය හා කිරම ප්‍රාදේශීය සභා උප කාර්යාල වලදී ලබා දීම සුදුසු බවත් ඉන් පසුව ඒ අනුව ළමුන් සම්මුඛ පරීක්ෂන මගින් බඳවා ගැනීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 3. කටුවන ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල මගින් සාහිත්‍ය මාසය හා කියවීම් මාසය මුල් කරගෙන ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන්</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කටුවන ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල මගින් සාහිත්‍ය මාසය හා කියවීම් මාසය හා මුල් කරගෙන ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 31 හා 2022.09.05 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල මගින් සාහිත්‍ය මාසය හා කියවීම් මාසය මුල් කර ගෙන ක්‍රියාත්මක කිරීමට නියමිත පහත වැඩසටහන් සකස් කර ඇති ඇස්තමේන්තු අනුව සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීම සුදුසු යයි යෝජනා කරමි.

<u>කිරම මහජන පුස්තකාලය</u>

01.සාහිත්‍ය මාසය සඳහා කිරම පෙර පාසල් දරුවන් සඳහා රසවින්දනාත්මක වැඩසටහනක් සංවිධානය කිරීම

02.කියවීම් මාසය සඳහා පුස්තකාලයේ පාඨකයින් වැඩි කර ගැනීමට අදාලව පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම.

03.ලෝක ළමා දිනය යෙදී ඇති ඔක්තෝම්බර් 01 දින පෙර පාසල් ළමුන් සඳහා ළමා දින කඳවුරක් පැවැත්වීම

<u>වරාපිටිය මහජන පුස්තකාලය</u>

01.සාහිත්‍ය මාසයට අදාළව රම්මලේ පෙර පාසල් දරුවන් සඳහා ළමා වැඩසටහනක් පැවැත්වීම

02.කියවීම් මාසය සඳහා පාතේගම කණිෂ්ඨ විද්‍යාලය මුල් කරගෙන ජංගම පුස්තකාල වැඩසටහනක් පැවැත්වීම හා සාමාජිකත්වය නොමිලේ ලබා දීම.

<u>මිද්දෙනිය මහජන පුස්තකාලය</u>

01. කියවීම් මාසය සඳහා කුඩහොඩ කණිෂ්ඨ විද්‍යාලය මූලික කරගෙන පොත් පෙට්ටි සංකල්පය-2022.10.12
02. කියවීම මාසයට අදාළව වැලිපිටිය ප්‍රාථමික විද්‍යාලය සඳහා ජංගම පුස්ථකාල සේවය-2022.1020
03. කියවීම මාසයට අදාළව මිද්දෙනිය පෙර පාසල සඳහා කතන්දර පැය (නාට්‍යානුසාරයෙන්) වැඩසටහන් පැවැත්වීම.2022.10.06

කටුවන මහජන පුස්තකාලය.

01.පුස්තකාල ජංගම සේවය (රුක්මල්පිටිය කණිෂ්ඨ විද්‍යාලය)-2022.10.31

02.කටුවන මහජන පුස්තකාලය මූලික කරගෙන 2022.10.07. සිට 2022.10.31 දක්වා නොමිලේ සාමාජිකයින් බඳවා ගැනීම.

03.සාමාජිකයින් සමඟ 2022.10.20 සිට 2022.10.31 දක්වා චිත්‍ර හා බැනර් ප්‍රදර්ශනයක් පැවැත්වීම.

ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

මේ වැඩසටහන් පවත්වන දින දැනුම් දෙන්නම්. ඔබතුමන්ලා මේ සඳහා සම්බන්ධ වෙන්න.

ඒ අනුව කටුවන ප්‍රාදේශීය සභාවට අයත් මහජන පුස්තකාල මගින් සාහිත්‍ය මාසය හා කියවීම් මාසය මුල් කරගෙන ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් සකස් කර ඇති ඇස්තමේන්තු අනුව සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 4. කිරම බස් නැවතුම්පොළ කඩ කාමර සම්බන්ධව</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කිරම බස් නැවතුම්පොළ කඩ කාමර සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 34/ ආදායම් II හා 2022.09.07 වන දින ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පෙත්සම් කාරක සභාවේ තීරණය පරිදි කිරම බස් නැවතුම්පොළ අසළ කේ.ජී. සෝමපාල මහතා සහ ජී. සුවිනීතා රංජනී මෙනවිය යන දෙමදනා විසින් සකස් කර ගෙන ඇති කඩ කාමර දෙක අංක 01 සහ 02 ලෙස නම් කර ඇති අතර කිරම බස් නැවතුම් පොළ කඩ කාමරද අංක 01 සිට 06 දක්වා නම් කර ඇති බැවින් පෙත්සම් කාරක සභාවේ තීරණය පරිදි ඉදිකර ගත් කඩ කාමර අංක 07 හා 08 ලෙස නම් කර ගිවිසුම් ගත වීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍ර සේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>

මේ ආකාරයට කඩ කාමර අංක කිරීමෙන් කාර්යාලයේ ලිපි ගොනු නඩත්තුවට හා ස්ථානය නිශ්චිත කර ගැනීමට පහසුවක් වෙනවා. එම නිසා පෙත්සම් කාරක සභාවේ තීරණය කර පරිදි ඉදි කර ගත් කඩ කාමර අංක 07 හා 08 ලෙස නම් කරන්න.

ඒ අනුව කිරම බස් නැවතුම්පොළ කඩ කාමර අතර පෙත්සම් කාරක සභාවේ තීරණය පරිදි කිරම බස් නැවතුම්පොළ අසළ කේ.ජී. සෝමපාල මහතා සහ ජී. සුවිනීතා රංජනී මෙනවිය යන දෙදෙනා විසින් සකස් කර ගෙන ඇති කඩ කාමර දෙක අංක 01 සහ 02 ලෙස නම් කර ඇති අතර කිරම බස් නැවතුම් පොළ කඩ කාමරද අංක 01 සිට 06 දක්වා නම් කර ඇති බැවින් පෙත්සම් කාරක සභාවේ තීරණය පරිදි ඉදිකර ගත් කඩ කාමර අංක 07 හා 08 ලෙස නම් කර ගිවිසුම් ගත වීම

සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වාර්තා

### 06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2022.09.05 වන දින

#### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

2022.09.05 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 105 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම් කිරීම සුදුසු බවත් යෝජනා අංක 01 ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

| අනු අංකය | නාම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 1. | එස්.දූෂාන්ති මිය,ආදායම් පරීක්ෂක,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 834.00 |
| 2. | ජේ.ඩිලාන් මයා,චන්ද්‍රා ස්ටෝර්ස්,මිද්දෙනිය පාර,කටුවන | 2022 ජූලි මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 6560.00 |
| 3. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,හිරම | 2022 ජූලි මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 5610.00 |
| 4. | කේ.එස්.එස්.පී.සමරසිංහ,සූරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | 227-5870 වෑන් රථය වාර සේවාව සිදු කිරීම | 26720.00 |
| 5. | ආර්.ජී.නුවන් ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 8412.75 |
| 6. | ජේ.ඒ.රංජිත් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 8412.75 |
| 7. | අයි.සුනිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 8412.75 |
| 8. | කීර්ති අබේනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 8412.75 |
| 9. | කේ.කේ.ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 3166.( |
| 10. | එම්.ඒ.චමින්ද කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 3166.50 |
| 11. | කේ.පී.සංජීව මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 4000.00 |
| 12. | පී.එම්.නිහාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 10241.00 |
| 13. | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 8832.00 |
| 14. | ප්‍රභාත් ජානක සම්පත් මයා,ආදේශක මුරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 1919.00 |
| 15. | ඕ.ඩී.ඩී.එමිල් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 6008.00 |

| | | | |
|---|---|---|---|
| 16. | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 7471.00 |
| 17. | එස්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 18. | ජනක පුෂ්පකුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 6315.00 |
| 19. | කුමාර පලිහක්කාර මයා, ,බැකෝ සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 4143.00 |
| 20. | දිමුතු සුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 6546.00 |
| 21. | අයි.ජී.මංජුල මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 1256.00 |
| 22. | ජී.කේ.ජී.ක්‍රිශාන්ත මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 6954.00 |
| 23. | සුජ්පා වඩිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 9249.00 |
| 24. | වයි.වී.දයානන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 7111.00 |
| 25. | එම්.අමරහේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 4266.00 |
| 26. | ජේ.එස්.චන්ද්‍රසිරි මයා, මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 5374.00 |
| 27. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 8166.00 |
| 28. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 2630.00 |
| 29. | ජී.පී.ප්‍රියමාල් හංසන මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1400.00 |
| 30. | ඩබ්.ආර්.කුමාර මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 31. | මොහන්දාස් සමරක්කොඩි,අංක 59,බොරැල්ල පාර,දෙහිගාම,පන්නිපිටිය | 2022 අප්‍රේල් මස කටුවන ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාල සඳහා මිලදී ගන්නා ලද "පාසල ක්ෂේම භූමියකි" කෘතියේ පිටපත් 08 ක් මිලදී ගැනීමට අදාලව ගෙවීම් කිරීම | 4000.00 |
| 32. | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව,අංක 15,දුම්රියපොළ පාර,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම<br>• 2" බයින්ඩර් ටේප් (කළු) 10-රු2820.00<br>• 2" බයින්ඩර් ටේප් (රතු) 10-රු2820.00<br>• White board marker නිල් 10-රු945.10 | 6585.10 |

| | | | |
|---|---|---|---|
| 33. | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව, අංක 15, දුම්රියපොළ පාර, මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම<br>• KN 95 face mask 200-රු 7000.00<br>• Champion soap 200-රු 26000.00 | 33000.00 |
| 34. | සී/ස ගුණවර්ධන සහ පුද්ගලික සමාගම,අංක 21 ඒ,කෙලින් විදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තණකොළ කපන මැෂින් තල 10 ක් හා ඉදල් 50 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 24750.00 |
| 35. | විභීෂ සර්විස් සෙන්ටර්,කටුවන පාර,මිද්දෙනිය | BAk-9907යතුරුපැදිය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 3550.00 |
| 36. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ උප කාර්යාලයට අවශ්‍ය සීනි 4Kg හා හකුරු පැකට් 12 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 5000.00 |
| 37. | එම්.වම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 38. | එම්.වම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 39. | එම්.වම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 40. | එම්.වම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 41. | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණය සඳහා ගෙවිය යුතු කඩ කුලිය මෙහෙයුම් හා නඩත්තු ගිණුමෙන් පොදු ගිණුමට මාරු කිරීම | 50000.00 |
| 42. | කේ.රූපසේන ,සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස අතිකාල දීමනා ගෙවීම | 1593.00 |
| 43. | එම්.කේ.ටී.චතුරිකා මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පරිවර්තිත ගමන් වියදම | 1740.00 |
| 44. | එම්.වම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පරිවර්තිත ගමන් වියදම | 2800.00 |
| 45. | කේ.ජේ.නාලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 9136.[illegible] |
| 46. | බී.ඒ.සමන් කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 47. | එස්.ජේ.චන්දන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 7910.00 |
| 48. | කේ.ටී.එම්.රුචිර ප්‍රියංකර මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 6491.00 |
| 49. | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පැය 80 ට වඩා වැඩි අතිකාල දීමනා ගෙවීම | 6835.00 |
| 50. | ජී.එම්.නිහාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පැය 80 ට වඩා වැඩි අතිකාල දීමනා ගෙවීම | 5746.00 |

| | | | |
|---|---|---|---|
| 51. | ජී.කේ.ජී.ක්‍රිශාන්ත මයා, බුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පැය 80 ට වඩා වැඩි අතිකාල දීමනා ගෙවීම | 3667.00 |
| 52. | ප්‍රභාත් ජනක සම්පත් මයා,ආදේශක බුරකරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පැය 80 ට වඩා වැඩි අතිකාල දීමනා ගෙවීම | 1717.00 |
| 53. | නන්දන කරුණාතිලක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පැය 80 ට වඩා වැඩි අතිකාල දීමනා ගෙවීම | 1941.00 |
| 54. | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පැය 80 ට වඩා වැඩි අතිකාල දීමනා ගෙවීම | 2988.00 |
| 55. | එස්.වසන්ත මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පැය 80 ට වඩා වැඩි අතිකාල දීමනා ගෙවීම | 3283.00 |
| 56. | දිමුතු සුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පැය 80 ට වඩා වැඩි අතිකාල දීමනා ගෙවීම | 5322.00 |
| 57. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.08.05 සිට 2022.08.08) | 15467.00 |
| 58. | එම්.ජී.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස ගමන් වියදම් ගෙවීම | 659.00 |
| 59. | එම්.ජී.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස ගමන් වියදම්ගෙවීම | 1164.00 |
| 60. | එම්.ජී.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස ගමන් වියදම්ගෙවීම | 1200.00 |
| 61. | කේ.එස්.එස්.සී.සමරසිංහ,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | PF-7414 කැබ් රථය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 34150.00 |
| 62. | ජේ.ජී.අනුර කුමාර,හයිඩ්‍රොලික් හෝස් සර්විස්,වීරකැටිය පාර,මිද්දෙනිය | ZA-2978 JCBයන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා හයිඩ්‍රොලික් හෝස් 02 ක් මිලදී ගෙන අලුත්වැඩියා කටයුතු නිම කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 9650.00 |
| 63. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.08.08 සිට 2022.08.23) | 9480.00 |
| 64. | විහාරාධිපති,අහලඛඩ පියසිරි හිමි,සිත්තම්ගල්ලෙන රජමහා විහාරය,වරාපිටිය | කටුවන ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක පොළ ව්‍යාපෘතියේ වරාපිටිය පොළ භූමිය ලබා දීම වෙනුවෙන් වූ බදු කුලී ගෙවීම(2022 වර්ෂයේ පළමු හා දෙවන කාර්තුවල ආදායමෙන් 5%) | 12299.00 |
| 65. | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | මෙහෙයුම් හා නඩත්තු ගිණුමට බැර වී ඇති මිද්දෙනිය සුසිරි වෙළඳ සංකීර්ණය වෙනුවෙන් ලැබී ඇති කඩ කාමර කුලිය පොදු ගිණුමට මාරු කිරීම | 100000.00 |
| 66. | එම්.ජී.සුගත් තිලක මයා,සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස අතිකාල දීමනා ගෙවීම | 7555.00 |
| 67. | රෝහිණී අබේනායක,කැෆේ ෆෝ යූ,කටුවන පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ ජූලි මස 21 දින පැවති මහා සභාවට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම් කිරීම(දිවා ආහාරය හා තේ පානය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන්) | 40310.00 |
| 68. | ලේකම්,අම්බලන්තොට ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවට අයත් මිද්දෙනිය බස් නැවතුම්පොළ අසල ඇති වැසිකිළිවල අපද්‍රව්‍ය | |

| | | | |
|---|---|---|---|
| | | ඉවත් කිරීම වෙනුවෙන් අම්බලන්තොට ප්‍රාදේශීය සභා ගලි බවුසරයට මුදල් ගෙවීම | 32200.00 |
| 69. | ආර්.ජී.නුවන් ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 8291.50 |
| 70. | අයි.සුනිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 8291.50 |
| 71. | ජේ.ඒ.රංජිත් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 8291.50 |
| 72. | කීර්ති අබේනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 8291.50 |
| 73. | එම්.ඒ.චමින්ද කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 3238.00 |
| 74. | ඉෂා.කේ.ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 3238.00 |
| 75. | කේ.සී.සංජීව මයා,සංවර්ධන නිළධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූනි මස පොළ අධීක්ෂණ දීමනාව | 4000.00 |
| 76. | සාමාන්‍යාධිකාරී,ශ්‍රී ලංකා දුම්රිය සේවය,කොළඹ 10 | Z836317,Z836318 දරන 2021761603 හා 2021 මැයි මසට අදාළ දුම්රිය බලපත්‍ර සඳහා මුදල් ගෙවීම | 1760.00 |
| 77. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.08.23 සිට 2022.08.26 දක්වා) | 15380.00 |
| 78. | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,යූනියන් පෙදෙස,කොළඹ 02 | කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය උප කාර්යාලයේ රැස්වීම් ශාලාවට පිවිසෙන ස්ථානයේ ඇති Pc 065398දරණ ඡායා පිටපත් යන්ත්‍රය සඳහා 2022.08.13 සිට 2023.08.12 දක්වා කාලය සඳහා සේවා ගිවිසුම අලුත්කිරීම සඳහා මුදල් ගෙවීම | 18161.54 |
| 79. | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,යූනියන් පෙදෙස,කොළඹ 02 | කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය උප කාර්යාලයේ සංවර්ධන අංශයට අයත් Pc 065397දරණ ඡායා පිටපත් යන්ත්‍රය සඳහා 2022.08.13 සිට 2023.08.12 දක්වා කාලය සඳහා සේවා ගිවිසුම අලුත්කිරීම සඳහා මුදල් ගෙවීම | 18161.54 |
| 80. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2022.08.26 සිට 2022.08.31 දක්වා) | 24317.00 |
| 81. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | රට තුළ පවත්නා ඉන්ධන හිඟය නිසා සභාව සතු වාහන සඳහා 2022.07.25 දින ඉන්ධන මිලදී ගැනීමට ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | 88000.00 |
| 82. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022.08.23 දින පැවති සැලසුම් කමිටුවට අදාළ දීමනාව ගෙවීම | 5000.00 |
| 83. | ඒ.වී.පී.යමුනා නිල්මිණී මිය,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 6200.00 |
| 84. | ඩිපෝ කළමනාකරු,ශ්‍රී ලංගම,තංගල්ල | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා ඉන්ධන 600L ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 258000.00 |
| 85. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,හම්බන්තොට | ස්ථාන මාරු ලබා පැමිණි සංවර්ධන නිළධාරි ඩබ්.එම්.ඒ.ධම්මිකා මියගේ ණය ශේෂ නිරවුල් කිරීමට අදාළ ගෙවීම් කිරීම | 160384.90 |
| 86. | එස්.දුෂාන්ති මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1581.00 |

| | | | |
|---|---|---|---|
| 87. | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | වැලිපිටිය ලයන් ස්පොට් ස්ලබ් ආයතනය විසින් 2022.01.09 වන දින මිද්දෙනිය නවෝදා පාසල් ක්‍රීඩාංගනයේදී පවත්වන ලද සංගීත ප්‍රසංගයෙහි නැන්පත් මුදල විනෝද බදු ආදායමට මාරු කිරීම | 7500.00 |
| 88. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය උප කාර්යාලයේ නිලධරයන්ට සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට තේ පැන් ලබා දීමට අවශ්‍ය සීනි, තේ කොළ හා හකුරු පැකට් මිලදී ගැනීම | 4800.00 |
| 89. | සෙනොක් ට්‍රේඩ් කම්බයින් (පුද්)සමාගම, | කටුවන ප්‍රාදේශීය සභාව සතු ZA-2978 අංක දරන බැකෝ යන්ත්‍රයට Tyre rod එකක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 36209.60 |
| 90. | එම්.කේ.ටී.චතුරිකා මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 91. | එම්.කේ.ටී.චතුරිකා මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 92. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුනි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 93. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජුලි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 94. | එල්.ජී.සම්පත් මයා,සසඳි මල්ටි කලෙක්ෂන්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය උප කාර්යාලයේ සංවර්ධන අංශයට අවශ්‍ය කාර්යාලීය මේසයක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 15900.00 |
| 95. | චන්ද්‍රා ස්ටෝර්ස්,අංක 107,මහ විදිය,ගොඩකවෙල | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය කාර්යාලීය ලිපි ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම<br>• A4 පැකට් 10-රු29500.00<br>• කැල්කියුලේටර් 20-රු89000.00<br>• ගම්බෝතල් 20-රු8500.00<br>• හකුරු 20-රු5000.00<br>• ෆයිල් කවු 10-රු1000.00<br>• බයින්ඩර් ටේප් 20-රු11000.00<br>• CR 160තනිරූල් පොත් 26-රු10400.00<br>• CR 40 තනිරූල් පොත් 20-රු1300.00<br>• බොක්ස් ෆයිල්20-රු17800.00 | 174500.00 |
| 96. | ඩබ්.ඉමේෂා මධුෂානි මෙය, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස කිරම පෙර පාසලෙහි පෙර පාසල් පුහුණු දීමනාව වෙනුවෙන් ගෙවීම | 6500.00 |
| 97. | කේ.ජී.එම්.පාරන්දි මෙය, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස මිද්දෙනිය පෙර පාසලෙහි පෙර පාසල් පුහුණු දීමනාව වෙනුවෙන් ගෙවීම | 10500.00 |
| 98. | ජී.ආර්.රශ්මී රවීනා මෙය, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස වරිපනම් ප්‍රතිශෝධන කටයුතුවලට සහය වීම වෙනුවෙන් දීමනා ගෙවීම | 33600.00 |
| 99. | ධම්මික ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, ඌරුබොක්ක පාර, කටුවන | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය කටුවන, මිද්දෙනිය, වරාපිටිය, ගොමඩිය, කිරම, කරමැටිය මහජන පොළ බිල්පොත් 300 ක් මුද්‍රණය කිරීමට අදාල ගෙවීම් කිරීම | 48000.00 |
| 100 | එම්.දිනුෂිත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |

| | | | |
|---|---|---|---|
| 101 | කේ.සී.සංජීව මයා,සංවර්ධන නිළධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 800.00 |
| 102 | ජී.පී.ප්‍රියමාල් හංසන මයා, සංවර්ධන නිළධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2450.00 |
| 103 | ඩී.සී.ජේ.පුෂ්පකුමාර මයා,ජනහිත මෝටර්ස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | RD-4364 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 34215.00 |
| 104 | එන්.ඩී.නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | PF-7414 කැබ් රථයට ලබා ගත් ඉන්ධන වෙනුවෙන් ගෙවීම් කිරීම | 36550.00 |
| 105 | පෝස්ට් මාස්ටර් ජනරාල්, තැපැල් කාර්යාලය, මිද්දෙනිය | 2022.09.05 දින සිට ඉදිරියට ලිපි තැපැල් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 30000.00 |

ඉහත වවුචර් අංක 01 සිට 105 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1) කිරම උප කාර්යාලයේ ඇති PC 066714 දරන ඡායා පිටපත් යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බවත්,ඒ බව සේවා ගිවිසුම්ගත වී ඇති ජෝන් කීල්ස් ආයතනයට දැනුම් දුන් බවත් ,එම ආයතනයෙන් ඡායා පිටපත් යන්ත්‍රය සකස් කිරීමට රු 99085.53 ක (වැට් සහිතව) ඇස්තමේන්තුවක් ලබා දී ඇති බව කිරම උප කාර්යාලයේ නියමිත නිළධාරී විසින් දැනුම් දී ඇත.ඒ අනුව එය සකස් කිරීමට සුදුසු බව යෝජනා විය.

ඉහත වවුචර් අංක 01 සිට 105 දක්වා වූ වවුචර් ගෙවීම කිරීමට සුදුසු බවත් යෝජනා අංක 01 ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව අංක 01 සිට 105 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01හි සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 අගෝස්තු මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 වර්ෂයේ අගෝස්තු මස මහ සභාව සතු සියළු වෙළඳ පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලැලි මගින් රු.511180.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 57413.00 ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.453767.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 අගෝස්තු මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2022 අගෝස්තු මස

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 අගෝස්තු මස හා වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:39500.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,රියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු:217607.00 ක වියදමක් දරා ඇත. එමෙන්ම මෙම යන්ත්‍රෝපකරණ මගින් රු: 178107.00ක අලාභයක් ලබා ඇත.

ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

අපේ යන්ත්‍රෝපකරණ වාර්තාව අලාභයක් විදියට තමයි තියෙන්නේ. අපිට පවතින ඉන්ධන මිල ගණන් සමග කුලිය වැඩි කරන්න වෙනවා.

ගරු ප්‍රා.ස.ම.කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා

එහෙම කරන්න. අනෙක් සභා වල යන්ත්‍රෝපකරණ කුලියට ලබා දෙන මිල ගණන් පිළිබද සළකා බලලා ඊට සාපේක්ෂව මෙම මිල ගණන් සංශෝදනය කරමු. දැනට ඉන්ධන අපි ලබා දීලා යන්ත්‍රෝපකරණ කුලියට දෙනවා නම් හොදයි.

ඒ අනුව 2022 අගෝස්තු මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සහ පවතින ඉන්ධන සහ යන්ත්‍රෝපකරණ කොටස් මිල ගණන් වලට සාපේක්ෂව යන්ත්‍රෝපකරණ කුලියට ලබා දීමේ මිල ගණන් සංශෝදනය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රිවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 4 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 අගෝස්තු

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සදහා අගෝස්තු මස රු.1019710.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 අගෝස්තු මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොමැති බැවින් සියළු මන්ත්‍රීතුමන්ලාගේ එකගතාවය මත සභා සම්මත කරන ලදී.

## 06 - 5 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2022 ජුනි මස

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

2022 ජුනි මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 2181936.82ක් වන අතර මාසික වියදම රු.1246661.30ක් වේ. ඒ අනුව මාසික ලාභය රු: 935275.52 කි. ඒ අනුව ජුනි මාසයට අදාළ ජල විශ්ලේෂණ වාර්තා සභාවේ අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම එම්.පී.සී.කැලුම් කුමාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා

අපේ දැනට විදුලි බිල් ඉහළ යාමත් සමග ජල ගාස්තු පිළිබඳ සංශෝධනයක් කළාද?

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

ඒ සම්බන්ධව කමිටුවක් මගින් තීරණයක් ගනිමු. අපි ජල සම්පාදන මණ්ඩලයට වඩා පහළින් තමයි මිල ගණන් යන්නේ.

ඒ අනුව 2022 ජූනි මස ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තා සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

06 - 6. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම -2022 ජූනි මස

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියට අදාළව මාසික ලැබීම් සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2022 ජූනි මස වන විට ආරම්භක හිඟය රු: 7607866.97 ක් වන අතර ජූනි මස අවසාන හිඟය රු: 7126246.08ක් වේ. ඒ අනුව හිඟයේ වෙනස රු: 481620.89කි. මෙම වාර්තාව සභා සම්මත කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ජල ව්‍යාපෘතියේ 2022 ජූනි මස මාසික ජල හිඟය අඩු වැඩි වීමේ වාර්තාව සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 16 වාර්ථා

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස 14,16 ,07 ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
  1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
  2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
  3. 0072633606- කර්මාන්ත ගිණුම
  4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
  5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
  6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම
- 2022 අගෝස්තු මස ප්‍රා.ඝ. 16 ,14,07 වාර්තා

ගරු ප්‍රා.ස.ම. ජේ.ජී. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 අගෝස්තු මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස.16 වාර්තා සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

08. වෙනත් යෝජනා

**08-1. අනුමැතියකින් තොරව සිදු කරන ලද ඉඩම් අනුබෙදුම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සදහා දඩ මුදල් අයකිරීම් සම්බන්ධව**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අනුමැතියකින් තොරව සිදු කරන ලද ඉඩම් අනුබෙදුම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සදහා දඩමුදල් අය කිරීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 05 හා 2022.09.14 දිනැතිව එවන ලද ලිපියට අනුව කටුවන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පවතින සංවර්ධන අධිකාරියට අයත් නොවන ප්‍රදේශයක ප්‍රාදේශිය සභාවේ අවශ්‍ය අනුමැති ලබා නොගෙන සිදු කරනු ලබන ඉඩම් අනු බෙදුම් හා ගොඩනැගිලි ඉදිකිරීම්/එකතු කිරීම්/නැවත ඉදිකිරීම් සදහා ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතට අනුව දඩ මුදල් අය කිරීම සදහා අවශ්‍ය සහා අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලුම් කර ඇති අතර එම කටයුතු සහා පනත් හා රීති වලට අනුකූලව සිදුකිරීම සුදුසු බවත් ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම එම්.ඩී.සුගතදාස මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, සභාවේ අනුමැතියකින් තොරව ඉදිකරන අනවසර ඉදිකිරීම් මේ ගණයට අයත් වෙනවද? මේ මගින් ඒවා නිත්‍යානු කූල වීමක් වෙනවද ?

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

එහෙම අයත් වෙන්නේ නැහැ. මේ සදහා ඉඩම් ඔප්පු ආදිය තියෙන්න ඕන. එහෙම නැතිව දෙන්නේ නැහැ. මේ අවසර ලබා දෙන්න පුළුවන් තැන් වල සකස් කරලා නමුත් අනුමැතිය ලබා නොගත් ඉදිකිරීම් ගැන තමයි කියන්නේ.

**ගරු ප්‍රා.ස.ම කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා.**

මේ සදහා අලුතින් සභා තීරණ අවශ්‍ය නැහැ. 1988 පනත සම්මත වූ දවසේ ඉදන් මේක ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා රීට අනුව කටයුතු කරන්න තමයි අවශ්‍ය වෙන්නේ. සාමාන්‍යයෙන් ප්ලෑන් එකක් අනුමත කරන්නේ ණයක් ලබා ගන්න අවශ්‍ය වූ විට.

**ගරු ප්‍රා.ස.ම කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මේ කැබලි අනුමත කිරීමෙදි හා වෙන්දේසි කිරීම් වලදි සභාවට අනුමැතියට ආවත් පරම්පරාගත ඉඩම් වල කොටස් බෙදා ගනිද්දි මේක සිදු වෙන්නේ නැහැ. නමුත් ඒ කැබලි අනුමත කරන්න වෙනවා. ඒ සම්බන්ධව මිනිස්සු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා දැනුවත් වෙනවා නම් හොදයි. ඒත් එක්කම අනවසර ඉදි කිරීම් සම්බන්ධව කථා කරද්දි පසුගිය දිනක කුරුණෑගල ළමයෙක් මරණයට පත් වූ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය කිරීමෙදි ඒ අනවසර ඉදිකිරීම සම්බන්ධව මාසිකව රැස්වන කමිටු වලදී ගත්තු තීන්දු තීරණ වල වැරදි තැන් තියෙනවා. ඒ සම්බන්ධව නිළධාරීන් නිහඩ වුණා. අපි එවැනි අනවසර ඉදිකිරීම සම්බන්ධව කමිටු මගින් ගන්න තීන්දු තීරණ නිවැරදි විය යුතුයි කියන එක මේ අවස්ථාවේ මතක් කරනවා.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පවතින සංවර්ධන අධිකාරියට අයත් නොවන ප්‍රදේශයක ප්‍රාදේශිය සභාවේ අවශ්‍ය අනුමැති ලබා නොගෙන සිදු කරනු ලබන ඉඩම් අනු බෙදුම් හා ගොඩනැගිලි ඉදිකිරීම්/එකතු කිරීම්/නැවත ඉදිකිරීම් සදහා ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතට අනුව දඩ මුදල් අය කිරීම සදහා අවශ්‍ය සභා අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලුම් කර ඇති අතර එම කටයුතු සභා පනත් හා රීති වලට අනුකූලව සිදුකිරීම සම්බන්ධවත් ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීම සම්බන්ධවත් විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-2. ජල පරිභෝජන හා ඇස්තමේන්තු ගාස්තු සම්බන්ධව**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

ජල පරිභෝජන හා ඇස්තමේන්තු ගාස්තු සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 10 හා 2022.09.12 දිනැති ලිපිය මගින් ඉල්ලුම් කර ඇති පරිදි වර්ථමානය වන විට ජල උපාංග වල මිල ගණන් සහ විදුලි බිලෙහි වැඩිවීමත් සමග නව සම්බන්ධතා ලබාදීම හා ජල බිල් ගාස්තුද ඊට සාපේක්ෂව ඉහළ දැමිය යුතු බව දන්වා ඇත. ඒ අනුව පහත කමිටුව මගින් එම වැඩි කළ යුතු මිල ගණන් පිළිබඳ සාකච්ඡා කර මිල සංශෝධන වාර්තාවක් ඉදිරිපත් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.ගරු ප්‍රා.ස.ම. ජේ.එල්. ජයන්ත මැතිතුමා

02.ගරු ප්‍රා.ස. ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා

03.ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.බී.හරිස්චන්ද්‍ර මැතිතුමා

04.ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා

05.ලේකම් - එම්. දිනුජිත් රන්දුල මයා

06. විෂය නිළධාරි - චමින්ද වික්‍රමසිංහ මහතා

07. තාක්ෂණ නිළධාරි - ඩබ්.ආර් කුමාර මහතා

08. ආදායම් පරීක්ෂක - එම්.කේ.ටී.චම්පිකා චතුරාණි මිය

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

අපි කමිටුව රැස් කරලා මිල ගණන් සංශෝදන වාර්තාවක් ඊළග සභාවට ඉදිරිපත් කරමු.

ඒ අනුව වර්තමානය වන විට ජල උපාංග වල මිල ගණන් සහ විදුලි බිලෙහි වැඩිවීමත් සමග නව සම්බන්ධතා ලබාදීම හා ජල බිල් ගාස්තුද ඊට සාපේක්ෂව ඉහළ දැමිය යුතු බැවින් ඒ සඳහා පත් කරන ලද කමිටුව මගින් එම වැඩි කළ යුතු මිල ගණන් පිළිබඳ සාකච්ජා කර මිල සංශෝධන වාර්තාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධවත් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-3 ZA 2978 බැකෝ යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු සම්බන්ධව</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

බැකෝ යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු කර ගැනීම මැයෙන් බැකෝ රියදුරු එම්.එස්. සේනාරත්න මයා විසින් සිදු කරන ලද ඉල්ලීමට අනුව ZA 2978 බැකෝ යන්ත්‍රයේ සඳහන් කර ඇති පහත අළුත්වැඩියා කටයුතු තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත සැපයුම් ආයතන මගින් මිල කැදවීම් කර හෝ නියෝජිත ආයතනය මගින් අදාළ මිලදී ගැනීම හා අලුත්වැඩියාවන් සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.ඉස්සරහ බකට් එකේ දත් ටික දැමීම සහ කටර් ප්ලේට් ටික රෙපෙයාර් කිරීම.

02. පිටුපස සපන්තු ජැක් පෙට්ටි දෙක සහ පින් දෙක රෙපෙයාර් කිරීම.

03.පිටුපස බැකෝ එකේ මුල පින් එක සහ බකට් පින් ටික රෙපෙයාර් කිරීම.

04. අඩි දෙකේ බකට් එක සහ අඩියේ බකට් එක රෙපෙයාර් කර දත් ටික දැමීම.

ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

මෙම අළුත්වැඩියා කටයුතු අදාළ ආයතන මගින් මිල කැඳවීම් සිදුකර හෝ නියෝජිත ආයතනය මගින් අවශ්‍ය අමතර කොටස් ගෙන්වා ගෙන සකස් කරන්න.

ඒ අනුව ZA 2978 බැකෝ යන්ත්‍රයේ සඳහන් කර ඇති පහත අළුත්වැඩියා කටයුතු තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර හෝ නියෝජිත ආයතනය මගින් අදාළ මිලදී ගැනීම් හා අලුත්වැඩියාවන් සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08- 4 .මිද්දෙනිය ආදුළුගොඩ මාර්ගය සංවර්ධනය කර ගැනීම

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මිද්දෙනිය ආදුළුගොඩ මාර්ගය සංවර්ධනය කර ගැනීම සඳහා වන ඉල්ලීම මැයෙන් අංක කප්‍රාස 24 හා 2022.09.14 දිනැතිව ඉදිරිපත් කර ඇති කමිටු වාර්තාවට අනුව මිද්දෙනිය ආදුළුගොඩ මාර්ගය සම්බන්ධයෙන් සිදුකර ඇති ස්ථානීය පරික්ෂාවෙහි නිරීක්ෂනයන් හා ඊට අදාළ නිගමනයන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව එහි සඳහන් පහත නිගමනයන්ට අදාළ කටයුතු සභාවේ යන්ත්‍ර සූත්‍ර හා සේවකයින් යොදා ගෙන සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.මාර්ගය හරහා අවහිර කර තිබෙන බෝක්කු ශුද්ධ කර කාණු පද්ධතිය සකස් කිරීම

02.කැඩී ගොස් ඇති කාපට් කොටස් සඳහා කාපට් යෙදීම

03.මාර්ග කම්කරුවන් යොදා මාර්ගය දෙපස ශුද්ධ කිරීම

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>

මම ස්ථානීය පරික්ෂනයට මමත් සම්බන්ධ වුණා. ගරු සභාපතිතුමණි, මෙම ස්ථානයේ විශාල වශයෙන් බැද්ද වැවිලා තියනවා. මොකද මිනිස්සු තමන්ගේ වත්ත ශුද්ධ කරලා පිරිසිදු කළාට පාරට අයිති කොටසෙහි තණකොළ ටික කපලා දාන්නේ නැහැ. ඒත් එක්කම මෙම ස්ථානයේ ස්වාභාවික වතුර බැස යන මාර්ගය එම ස්ථානයේ නිවෙස් හිමියෙක් විසින් අවහිර කිරීමත් ගැටළුවක් වෙලා තියෙනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි කමිටුව මගින් ඉදිරිපත් කර ඇති නිගමනයන් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබා දෙමු.

<u>ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>

ඔව්. ඒක හොඳයි. අපි ඒ තීරණ ක්‍රියාත්මක කරමු.

ඒ අනුව මිද්දෙනිය පාදුළුගොඩ මාර්ගයෙහි ස්ථානීය පරික්ෂාවෙහි නිරීක්ෂණයන් හා ඊට අදාළ නිගමනයන් අනුව සභාවේ යන්ත්‍ර සූත්‍ර හා සේවකයින් යොදා ගෙන එම පිළිසකර කිරීම සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-5. ඇස්තමේන්තු සංශෝධනය කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

කිරම බස් නැවතුම්පොළ අසළ කඩ කාමර දෙකක් ඉදිකිරීමට අදාළව සකස් කරන ලද සංශෝධිත ඇස්තමේන්තු මුදල වන රු.4354226.25 ක ඇස්තමේන්තුව සහ රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණයේ වැසිකිළිය ඉවත් කර කඩ කාමරයක් ඉදි කිරීමට අදාළව සකස් කරන ලද සංශෝධිත ඇස්තමේන්තුව වන රු. 2005269.72ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මේ ඇස්තමේන්තු අපි කළින් අනුමත කළත් නව මිල ගණන් අනුව ඇස්තමේන්තු නැවත සකස් කරලා තියෙනවා. නව සංශෝධිත ඇස්තමේන්තු අනුමත කරමු. ඒ අනුව අදාළ ඉදිකිරීම කරමු.

ඒ අනුව කිරම බස් නැවතුම්පොළ අසළ කඩ කාමර දෙකක් ඉදිකිරීමට අදාළව සකස් කරන ලද සංශෝධිත ඇස්තමේන්තු මුදල වන රු.4354226.25 ක ඇස්තමේන්තුව සහ රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණයේ වැසිකිළිය ඉවත් කර කඩ කාමරයක් ඉදි කිරීමට අදාළව සකස් කරන ලද සංශෝධිත ඇස්තමේන්තුව වන රු. 2005269.72ක ඇස්තමේන්තුව අනුමත කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-06. අ.ග.පි 402 ලොට් අංක 493 දරණ ඉඩම සම්බන්ධව

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අ.ග.පි. 402 ලොට් අංක 493 දරණ ඉඩම සම්බන්ධව 2022.09.14 දිනැතිව ඉදිරිපත් කර ඇති කමිටු නිර්දේශයන් සළකා බලා මෙම ඉඩම අදාළ වගා කටයුතු සිදු කරන පුද්ගලයා වෙත පවරා දීම සම්බන්ධව කටුවන ප්‍රාදේශිය සභාවේ විරුද්ධත්වයක් නොමැති බව කටුවන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත දන්වා යැවීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී රමණී හල්පෙගමගේ මැතිතුමිය යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මෙ සම්බන්ධව පසුගිය සභාවකදී අපි කමිටුවක් පත් කරලා ස්ථාන පරීක්ෂාවක් කළා. එහි නිර්දේශ අතර මෙම ඉඩමේ දැනට ඵල දරණ දිර්ඝ කාලින ගම්මිරිස් වගාවක්ද, පොල් සහ කජු ආදි වගාවන්ද පවතින බවත්, රජයේ ගොඩනැගිලි කිසිවක් නොමැති බවත් , මෙම ඉඩම සභාවේ ස්ථාවර වත්කම් වල නොමැති බවත් හුංගම මිද්දෙනිය ප්‍රධාන මාර්ගයේ සිට 3km ගිය පසු හමුවන ඉතා දුෂ්කර මාර්ගයක ඉඩම පිහිටා ඇති බවත් නිර්දේශ කර ඇත. අපිට ප්‍රයෝජනයක් නැති නිසා මේ ඉඩම සඳහා වැවිලි කරුට බලපත්‍රයක් ලබා දෙන්න අනුමැතිය දෙමු.

ඒ අනුව අ.ග.පි. 402 ලොට් අංක 493 දරණ ඉඩම සම්බන්ධව කමිටු නිර්දේශයන් සළකා බලා මෙම ඉඩම අදාළ වගා කටයුතු සිදු කරන පුද්ගලයා වෙත පවරා දීම සම්බන්ධව කටුවන ප්‍රාදේශීය සභාවේ විරුද්ධත්වයක් නොමැති බව කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා යැවීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-7. මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 21 සිට 25 දක්වා කඩ කාමර හා දෙවන මහල සාකච්ඡාව සම්බන්ධවයි</u>**

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 21 සිට 25 දක්වා හා දෙවන මහල සම්බන්ධව පැවති සාකච්ඡාවට අදාළ වාර්තාවට අනුව එම කඩ කාමර වල බදු කරු වන විජේසිරි කුලතුංග මහතාට මෙම කඩ කාමර ලබා දීම සම්බන්ධ මුල් තොරතුරු හම්බන්තොට සහකාර කොමසාරිස් කාර්යාලයෙන් හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පි.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි පසුගිය දිනක කුමා ස්ටිකර් ආයතනය සමග සාකච්ඡාවක් සිදු කළා. එහි ගනු ලැබූ තීන්දු තීරණ අතර එතුමා 2023 වර්ෂයේ අප්‍රේල් වන විට මෙහි වැඩ අවසන් කරන බවත් හිඟ මුදල් ගෙවන බවත් කිව්වා.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ජ්.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මම මේ සම්බන්ධව කතා කළා. මෙහි වැඩ ආරම්භ කරන්න කියලා ඉල්ලීම කළා. නමුත් ඔවුන් කියන්නේ වසර 30ක් සඳහා ගිවිසුම් ගත වෙලා තියනවා කියලා තමයි ඒ පාර්ශවය කියන්නේ. නමුත් ඒ අදාල ලිපි ලේඛන අපි ළඟ නැහැ. ඒ සියල්ල ගෙන්න ගන්න. කෙසේ හෝ මේක පටන් අරගෙන ජනතාවට සේවයක් වෙන්න ඕන. මිද්දෙනියට තියන සම්පතක් වුණත් ඒ ගිවිසුම් සමග අපිට ආපසු ගන්න බැහැ.

<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

මේ ලිපිලේඛන පරීක්ෂා කරද්දි මේ ටෙන්ඩරය තුළ තිස් අවුරුදු බද්දක් කියන එක පැහැදිලිව සටහන් වෙන්නේ නැහැ. වසර 3ක් පිළිබඳවත් මෙහි සඳහන් වෙනවා. ඒත් එක්කම මේ සම්බන්ධව සභාවේ අධීක්ෂණයක් තියෙන්න ඕන කියන එකත් එහි සඳහන් වෙනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මේක නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂනය යටතේ තමයි සිදු කරලා තියෙන්නේ. ඉදිරියේදී අපේ තාක්ෂණ නිළධාරින් මෙහි අධීක්ෂණයට යොමු කරමු.

<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍ර සේන මැතිතුමා</u>

අපි කොමසාරිස් කාර්යාලයේ තියන ලිපි ගොනු ගෙන්වා ගනිමු. ඒවා අධීක්ෂනය කරලා බලන්න වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. ජේ.එල්.ජයන්ත මැතිතුමා</u>

මේ කඩ කාමර ඉදි කරද්දි සභාපතිතුමන් අධීක්ෂණය කළාද? මට පේන විදියට දෙවන මහලට යන්න තැනක් නැහැ නේද?

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමණි, අපි කොහොම කළත් මේ පාර්ශවය විසින් අපිව රැවටීමක් තමයි කරන්නේ. මොකද ඒ අය සාකච්ඡාවට ඇවිත් ඉදිරියේදි වැඩ ආරම්භ කරන බව කිව්වත් ඒක කරන්නේ නැහැ. මගේ පෞද්ගලික අදහස නම් ඊළග අප්‍රේල් මාසයේදිවත් මෙ කටයුතු ආරම්භ කරන්නේ නැහැ. සභාවක් විදියට සභා පරිපාලන කාල සීමාවන් තුනක් යටතේ අපිට තවමත් මේකෙන් ජනතාවට සේවයක් කරන්න බැරි වුණා. මෙතුමා තව දුරටත් මේ කාර්යය කරන්නේ නැත්නම් පළාත් පාලන කොමසාරිස් දැනුවත් කරලා නීතිමය ක්‍රියාමාර්ග ගන්න කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණයේ අංක 21 සිට 25 දක්වා හා දෙවන මහල සම්බන්ධව පැවති සාකච්ඡාවට අදාළ වාර්තාවට අනුව එම කඩ කාමර වල බදු කරු වන විජේසිරි කුලතුංග මහතාට මෙම කඩ කාමර ලබා දීම සම්බන්ධ මුල් තොරතුරු හම්බන්තොට සහකාර කොමසාරිස් කාර්යාලයෙන් හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-8. වවුචර් සදහා ගෙවීම් කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් කඩිනමින් ගෙවිය යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.වවුචර් අංක 709 - ඩී.බී.ජී. පුෂ්ප කුමාර, ජනහිත මෝටර්ස්, වලස්මුල්ල පාර, මිද්දෙනිය. - කටුවන ප්‍රාදේශිය සභාව සතුව තිබෙන SG – SYMST මාදිලියේ විදුලි ජනක යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු සදහා ගෙවීම - රු. 18240.00

02. වවුචර් අංක 07 - මැල්ලකැටිගොඩ ගොවි සංවිධානය, මැල්ලකැටිගොඩ, මිද්දෙනිය - පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම යටතේ මිද්දෙනිය සිට කටුවන දක්වා වැටෙන වත්තෙහේන මාර්ගයේ ඉදිකළ පාලම දෙපස පැති බැම් දෙකක් ඉදිකිරීම - රු.1541864.68

03. වවුචර් අංක 138 - පළාත් භාර අධ්‍යක්ෂ ( දකුණ), මාර්ග සංවර්ධන අධිකාරිය, මාතර- 2022 මැයි මස 05 වන දින ප්‍රාදේශිය සභාව ඉදිරිපිට මිද්දෙනිය , වීරකැටිය මාර්ගයේ මාර්ග පළදුකිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල ගෙවීම.- රු. 43665.93

04. වවුචර් අංක 205 - ඩී.බී.ජී. පුෂ්පකුමාර- ජනහිත මෝටර්ස්, වලස්මුල්ල පාර , මිද්දෙනිය - RB 3498 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් වැය වූ මුදල් ලබා දීම - රු. 6600.00

05.වවුචර් අංක 206- ඩී.බී.ජී. පුෂ්පකුමාර- ජනහිත මෝටර්ස්, වලස්මුල්ල පාර , මිද්දෙනිය - RC 5539 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම් වෙනුවෙන් වැය වූ මුදල් ලබා දීම - රු. 41250.00

06. වවුචර් අංක 691 - සාමාන්‍යාධිකාරි, සී.ස.වි.සේ.සමූපකාර සමිතිය - කටුවන ප්‍රාදේශිය සභාව සතු වාහන හා පොදු සේවා වෙනුවෙන් ගබඩා කිරීම සදහා 2022.08.23 සිට 2022.08.31 දක්වා කාලය තුළ ඉන්ධන සැපයීම - රු. 274310.00

07. වවුචර් අංක 695 - සාමාන්‍යාධිකාරි, සි.ස.වි.ශේ.සමුපාකාර සමිතිය - කටුවන ප්‍රාදේශිය සභාව සතු වාහන හා පොදු සේවා වෙනුවෙන් ගබඩා කිරිම සඳහා 2022.09.06 සිට 2022.09.12 දක්වා කාලය තුළ ඉන්ධන සැපයීම - රු. 339140.00

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පි.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් එම වවුචර් පරීක්ෂා කර බලා ගෙවීම කිරිම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලූ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

<u>09.ප්‍රගතිය සාකච්ඡා කිරීම</u>

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, තිරම නඩ කාමර හදලා දෙන අය තුන් දෙනෙක් ඉන්නවා නේද? ඒ අයට කඩ කාමර සකස් කරලා දෙනවද? එතන එක් අයෙකුට ගැටළුවක් තියෙනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඔබතුමන්ගේ ඉල්ලීම පරිදි පසුගිය දිනක තිරම බස් නැවතුම්පොළ කඩ කාමර බෙදා දිම සම්බන්ධව අපි සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ අවස්ථාවට ඔය කියන පුද්ගලයන් තුන් දෙනාම ආවා. එතනින් දෙදෙනෙක් කඩ කාමර සකස් කර ගන්න එකඟ වුණා. නමුත් ඔය කියන පුද්ගලයා මාත් එක්ක කථා කලේ නැහැ. ඒ අයට ගැටළුවක් තියනවා නම් තැන් තැන් වල කතා නොකර ප්‍රශ්නයට උත්තරයක් ගන්න නම් මාත් එක්ක කතා කරන්න තිබුණා. ඒ පුද්ගලයාට මාත් එක්ක කථා කරන්න කියන්න.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

මේ පුද්ගලයාට ඔබතුමා හමුවෙලා කතා කරන්න කියන්නද? ඒ අයට කඩ කාමරය හදා ගන්න මුදල් නොමැති නිසා ඒකට විසඳුමක් ලබා ගන්න තමයි ඕන. ඔය කියන ස්ථානයේ තවත් කඩ කාමරයක් සකස් කරන්න ඉඩ තියනවා නේද?

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි ඒ ගැන බලලා දෙන්න ඒ පුද්ගලයා හමු වෙන්න ආව නම් හරි. ඊට පසුව ඉඩ තියන ස්ථානයක් බලලා නම් කරලා දෙන්නම්.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා</u>

කොහොම වුණත් ඉදිරියේදි කොමසාරිස් පාලනයකට ගියොත් අපි ගත්තු තීන්දු තීරණ ක්‍රියාත්මක කර ගන්න අසීරු වෙනවා. ඒ නිසා මේ කටයුතු කඩිනමින් කර ගන්න . අනෙක් කාරණය ඒ කඩ කාමර ලබා දිම පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වූවා නම් ඒකට සහභාගි වෙලා අවශ්‍ය දේවල් ඒ පුද්ගලයාට කථා කර ගන්න පුළුවන්. ඒ පිළිබඳ තැන් තැන් වල ඉඳගෙන කථා කරන්න අවශ්‍යතාවයක් නැහැ.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී රමණි හල්පෙගමගේ මැතිතුමිය</u>

ගරු සභාපතිතුමණි, අක්‍රිය වෙලා තියන විදි පහන් නැවත සකස් කරලා දෙන්න ක්‍රමවේදයක් සකස් කරනවද?

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඔව, අපි දැනට සිත්තම්ගල්ලෙන රජමහා විහාරයේ වාර්ෂික ඇසළ මහා පූජෝත්සවය නිමිති කර ගෙන ඒ සඳහා සභාව විදියට අපි විසින් කළ යුතු කාර්යයන් තිබෙනවා. පසුගිය දිනක සාකච්ඡාවක් ඒ සඳහා පැවැත්වූවා. ඒ නිසා අපි විදි පහන් සකස් කරන්න මේ දිනවල අපේ වාහන සිත්තම්ගල්ලට යවලා තියෙනවා. ඒ වගේම අපේ මෝටර් ග්‍රේඩරය සහ JCB එකත් ඊට අදාළ සේවකයිනුත් අපි ඒ

කටයුතු සඳහා යොදවලා තියෙනවා. සිත්කම්ගල්ලෙන කටයුතු වලින් පසුව අපි නැවත කොට්ඨාශ මට්ටමින් විදි පහන් අලුත් වැඩියාවන් සඳහා අපේ සේවකයින් සහ වාහන යොදවන්නම්.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.කේ.ඒ. ආනන්ද කුලසුන්දර මැතිතුමා</u>

ගරු සභාපතිතුමන් ඇතුළු සියලූ දෙනාගෙන් අවසරයි. මෙම පළාත් පාලන ආයතන වල සභාව සතු කාල සීමාව මෙම මාසයෙන් අවසන් වීමට නියමිත වුණත් ඊට පසුව කොමසාරිස් පාලනයකට යනවද එහෙම නැත්නම් පාර්ලිමේන්තුවේ නැවත සම්මත කරලා ඉදිරියට යනවද කියන එක ගැන තවම අදහසක් නැහැ. රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණය සම්බන්ධයෙන් යම් ගැටළුවක් තියෙනවා. 2006-2011 කාල සීමාව තුළ මෙම යෝජනාව එද්දි කිහිප දෙනෙක් විරුද්ධ වුණත් අදාළ පාර්ශවය විසින් දේශපාලන මැදිහත්වීමක් මත මෙය ලබා දුන්නා. නමුත් මේ සභාවට අයත් ගොඩනැගිල්ලක්. සභාවට අයිති දේපලක්. සභාවේ සභිකයින් විදියට මේ සම්බන්ධව මේ කාර්යය සිදු වූ ආකාරය පිළිබද අපිට දැන ගන්න අයිතියක් තියෙනවා. එහෙම නැත්නම් පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාවකට හරි යොමු කරලා මේ පිළිබද දැන ගැනීමට අවශ්‍යයි. මේ වාර්තාව කියවා බලද්දි සභාවට තිබු බලතල තුමක්ද යන්න පිළිබද කණගාටුයි. ඒ නිසා මේ සම්බන්ධව එම ලිපි ගොනු ගෙන්වා බලා පරීක්ෂා කිරීමක් කරලා අපිව දැනුවත් කිරීමක් සිදු කරන්නත් කඩිනමින් මෙම ගොඩනැගිලි ජනතා සේවය සඳහා අවශ්‍ය පරිදි ලබා දෙන්නත් අවශ්‍ය කටයුතු සිදු කරන්න කියලා යෝජනා කරනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි ඒ ලිපි ගොනු ගෙන්වා බලා අවශ්‍ය කටයුතු කරමු.

## <u>10. - ස්තුතිය හා නිමාව.</u>

අද දින 2022 වර්ෂයේ සැප්තැම්බර් මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වුන අපේ ගරු උප සභාපතිතුමන්, හිටපු ගරු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා, නිළධාරිතුමිය, ඇතුළු සියළුම දෙනාට ස්තුතිවන්ත වෙමින් අද දවසේ සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව 01.30 ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියහ.

.........................

අයි. ජී. මහින්ද,

අයි.ජී.මහින්ද,
සභාපති
කටුවන ප්‍රාදේශීය සභාව
මිද්දෙනිය.

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.